# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2004/53 – 2017 පෙබරවාරි 02 වැනි බ්‍රහස්පතින්දා – 2017.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව
**2017 අංක 40 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/4/2013/ඩී/147.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: වීඊ/ඩීඑස්/එල්එල්ඩී/එල්ඒ/පීඊටීඑච්/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 ජනවාරි මස 30 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, වලිකාමම් නැගෙනහිර කෝපායි.

2. **ඉඩමේ විස්තරය.** – උතුරු පළාතේ, යාපනේ දිස්ත්‍රික්කයේ, වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ජේ/281 පත්තමේනි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පත්තමේනි ගමේ පිහිටි, යාපනය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක Ya/KPY/2014/42 හා 2014.05.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.2946 ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කුතන් තෝට්ටම් – ප්‍රමාණය: හෙක්. 0.2946**
උතුරට: යෝගම්පිහෙයි යෝගරාජා සහ ලක්ටීසියා අරුලානන්දම් හිමිකම් කියන තුත් තෝට්ටම්; නැගෙනහිරට: ලක්ටීසියා අරුලානන්දම් සහ වෛත්තිය ලිංගම් රත්නේස්වරී හිමිකම් කියන තුත් තෝට්ටම්; දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: කන්දසාමි ගනේශමූර්ති හිමිකම් කියන තුත් තෝට්ටම්.

02 - 692


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.